(අටවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක 68.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2019 ජූනි 18** වැනි අඟහරුවාදා අ.භා. **1.00** ට

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

ගරු **ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා

ගරු **තලතා අතුකෝරල මහත්මිය,** අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **රවී කරුණානායක මහතා,** විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **අකිල විරාජ් කාරියවසම් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **පලනි දිගම්බරම් මහතා,** කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,** බුද්ධ ශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යතුමිය

ගරු **ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,** රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යතුමා

ගරු **සාගල රත්නායක මහතා,** වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **අර්ජුන රණතුංග මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **මංගල සමරවීර මහතා,** මුදල් අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා

ගරු **පී. හැරිසන් මහතා,** කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන ආර්ථික ප්‍රතිසංස්කරණ සහ පොදු සැපයීම් අමාත්‍යතුමා

ගරු **අජිත් පී. පෙරේරා මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන විශේෂ ප්‍රදේශ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **රුවන් විජයවර්ධන මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුජීව සේනසිංහ මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා

ගරු **අශෝක් අබේසිංහ මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජේ. සී. අලවතුවල මහතා,** අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රංජිත් අලුවිහාරේ මහතා,** සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලකී ජයවර්ධන මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිරෝෂන් පෙරේරා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. ප්‍රේමදාස මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජයකලා මහේස්වරන් මහත්මිය,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **අජිත් මාන්නප්පෙරුම මහතා,** මහවැලි සංවර්ධන හා පරිසර රාජ්‍ය අමාත්‍ය

ගරු **රන්ජන් රාමනායක මහතා,** මහාමාර්ග හා මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉරාන් වික්‍රමරත්න මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වඩිවේල් සුරේෂ් මහතා,** වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **එඩ්වඩ් ගුණසේකර මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **පාලිත කුමාර තෙවරප්පෙරුම මහතා,** සමාජ සවිබලගැන්වීම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **කරුණාරත්න පරණවිතාන මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා

ගරු මහින්ද අමරවීර මහතා

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා

ගරු ලසන්ත අලගියවන්න මහතා

ගරු ඩලස් අලහප්පෙරුම මහතා

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු (ආචාර්ය) එස්. එම්. මොහමඩ් ඉස්මායිල් මහතා

ගරු ෆයිසාල් කාසිම් මහතා

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා

ගරු පියසේන ගමගේ මහතා

ගරු සිරිපාල ගමලත් මහතා

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු මලිත් ජයතිලක මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු අනුරාධ ජයරත්න මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු එම්. එස්. තෞෆික් මහතා

ගරු  පියල් නිශාන්ත ද සිල්වා මහතා

ගරු  මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා

ගරු  නිමල් සිරිපාල ද සිල්වා මහතා

ගරු  ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු  අනුර දිසානායක මහතා

ගරු  මයන්ත දිසානායක මහතා

ගරු  විමලවීර දිසානායක මහතා

ගරු  වීරකුමාර දිසානායක මහතා

ගරු  සාලින්ද දිසානායක මහතා

ගරු  එච්. ආර්. සාරතී දුෂ්මන්ත මහතා

ගරු  ඩග්ලස් දේවානන්ද මහතා

ගරු  එස්. බී. නාවින්න මහතා

ගරු  මුහම්මදු නසීර් මහතා

ගරු  ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු  කේ. කේ. පියදාස මහතා

ගරු  සුසන්ත පුංචිනිලමේ මහතා

ගරු  ඩිලාන් පෙරේරා මහතා

ගරු  සනත් නිශාන්ත පෙරේරා මහතා

ගරු  ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා

ගරු  සුජිත් සංජය පෙරේරා මහතා

ගරු  අශෝක ප්‍රියන්ත මහතා

ගරු  අරුන්දික ප්‍රනාන්දු මහතා

ගරු  (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු  ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා

ගරු  එස්. ප්‍රේමරත්න මහතා

ගරු  පාලිත රන්ගේ බණ්ඩාර මහතා

ගරු  ශාන්ත බණ්ඩාර මහතා

ගරු  ඉන්දික බණ්ඩාරනායක මහතා

ගරු  රිසාඩ් බදියුදීන් මහතා

ගරු  තාරානාත් බස්නායක මහතා

ගරු  තාරක බාලසූරිය මහතා

ගරු  විජිත බේරුගොඩ මහතා

ගරු  මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු සෙය්යිඩ් අලි සාහීර් මවුලානා මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු බිමල් රත්නායක මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු ප්‍රසන්න රණතුංග මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු රොෂාන් රණසිංහ මහතා

ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු වමල් රාජපක්ෂ මහතා

ගරු මහින්ද රාජපක්ෂ මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා

ගරු අංගජන් රාමනාදන් මහතා

ගරු නිමල් ලාන්සා මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු කංචන විජේසේකර මහතා

ගරු ඩුලිප් විජේසේකර මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු තේනුක විදානගමගේ මහතා

ගරු එස්. වියාලේන්දිරන් මහතා

ගරු චන්දිම වීරක්කොඩි මහතා

ගරු විමල් වීරවංශ මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු එස්. ශ්‍රීතරන් මහතා

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය

ගරු ජයන්ත සමරවීර මහතා

ගරු සන්දිත් සමරසිංහ මහතා

ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා

ගරු ඊ. සරවනපවන් මහතා

ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා

ගරු රංජිත් සියඹලාපිටිය මහතා

ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා

ගරු මුත්තු සිවලිංගම් මහතා

ගරු අන්නාමලෙයි නඩේසු සිවශක්ති මහතා

ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා

ගරු තිලංග සුමතිපාල මහතා

ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා

ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා

ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා

ගරු ශෙහාන් සේමසිංහ මහතා

ගරු විජිත් විජයමුණි සොයිසා මහතා

ගරු රවුෆ් හකීම් මහතා

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා

ගරු එච්. එම්. එම්. හරීස් මහතා

ගරු අබ්දුල් හලීම් මහතා

ගරු කබීර් හෂීම් මහතා

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා

ගරු කනක හේරත් මහතා

ගරු විජිත හේරත් මහතා

**ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා**

**ගරු ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්—

(i) 2018 වර්ෂය සඳහා අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව;

(ii) 2018 වර්ෂය සඳහා අග්‍රාමාත්‍ය කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව; සහ

(iii) 2017 වර්ෂය සඳහා පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) කාර්යාලයේ වාර්ෂික වාර්තාව

පිළිගන්වා, එම වාර්තා අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2017 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යවරයා විසින්, 2018 වර්ෂය සඳහා රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්—

(i) 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(ii) 2018 වර්ෂය සඳහා ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ

(iii) 2018 වර්ෂය සඳහා ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව

පිළිගන්වා, එම වාර්තා කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්—

(i) 2019 අංක 6 දරන විසර්ජන පනතේ 6(1) වගන්තිය යටතේ 2019.04.01 සිට 2019.05.31 දක්වා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන;

(ii) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 මාර්තු 05 දිනැති අංක 2113/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iii) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 මාර්තු 13 දිනැති අංක 2114/25 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iv) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 මාර්තු 14 දිනැති අංක 2114/49 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(v) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 මැයි 13 දිනැති අංක 2123/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය

පිළිගන්වා, එම පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන සහ නියමයන් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්—

(i) 2018 වර්ෂය සඳහා හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව හා ගිණුම්;

(ii) 2018 වර්ෂය සඳහා කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන හා ගිණුම් වාර්තාව;

(iii) 2018 වර්ෂය සඳහා රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන හා ගිණුම් වාර්තාව;

(iv) 2018 වර්ෂය සඳහා මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන හා ගිණුම් වාර්තාව;

(v) 2018 වර්ෂය සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව හා ගිණුම්;

(vi) 2018 වර්ෂය සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(vii) 2018 වර්ෂය සඳහා අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ස්වදේශ කටයුතු අංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව හා ගිණුම්; සහ

(viii) 2018 වර්ෂය සඳහා අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ පළාත් සභා හා පළාත් පාලන අංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව

පිළිගන්වා, එම වාර්තා අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2015 වර්ෂය සඳහා විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව සෞඛ්‍ය හා මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(8) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2018 වර්ෂය සඳහා නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව සෞඛ්‍ය හා මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(9) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2018 වර්ෂය සඳහා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව තරුණ, ක්‍රීඩා, කලා හා උරුමයන් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(10) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2018 වර්ෂය සඳහා ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව ප්‍රතිසන්ධාන හා උතුරු හා නැගෙනහිර නැවත ගොඩනැගීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**2. කාරක සභා වාර්තා පිළිගැන්වීම** : රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) මහජන බැංකු (සංශෝධන) පනත් කෙටුම්පත; සහ

(ii) සුරාබදු ආඥා පනත යටතේ නිවේදන

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

**3. මහජන පෙත්සම් පිළිගැන්වීම :**

(1) පන්නිපිටිය, පැලැන්වත්ත, කනත්ත පාර, අංක 217/1/4 දරන ස්ථානයෙහි පදිංචි එම්. ජී. සරත් මහතාගෙන් ලැබුණු 2018.09.20 දිනැති පෙත්සම ගරු අකිල විරාජ් කාරියවසම් මහතා විසින් පිළිගන්වන ලදී.

(2) (i) බුලත්කොහුපිටිය, උඩපොත, සිව්ගිරිවත්ත යන ලිපිනයෙහි පදිංචි එච්. පී. ප්‍රේමාවතී මහත්මියගෙන් ලැබුණු 2019.01.19 දිනැති පෙත්සම; සහ

(ii) නුගගොල්ල, 80 යාය, අංක 16/23 දරන ස්ථානයෙහි පදිංචි කේ. පී. සී. රාජංගන මහතාගෙන් ලැබුණු 2019.01.12 දිනැති පෙත්සම

ගරු වසන්ත අලුවිහාරේ මහතා විසින් පිළිගන්වන ලදී.

(3) නවගමුව, දකුණ රනාල, අංක 331/3 දරන ස්ථානයෙහි පදිංචි ආර්. වී. කේ. පතිරගේ මහත්මියගෙන් ලැබුණු 2019.03.04 දිනැති පෙත්සම ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා විසින් පිළිගන්වන ලදී.

(4) කටුගස්තොට, හමංගොඩ, අංක 96/1/ඒ දරන ස්ථානයෙහි පදිංචි එම්. වී. සී. ආරියරත්න මහතාගෙන් ලැබුණු 2018.06.13 දිනැති පෙත්සම ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා විසින් පිළිගන්වන ලදී.

(5) තලාතුඔය, හිප්පල පාර, "සඳමාලි" යන ලිපිනයෙහි පදිංචි එච්. බී. එම්. ඩබ්ලිව්. අබේරත්න බණ්ඩාර මහතාගෙන් ලැබුණු 2018.08.19 දිනැති පෙත්සම ගරු මයන්ත දිසානායක මහතා විසින් පිළිගන්වන ලදී.

30 (10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**4. රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනත යටතේ නියෝග :** මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනතේ 16 වගන්තිය සමඟ කියවිය යුතු 112 වගන්තිය යටතේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2018 දෙසැම්බර් 31 දිනැති අංක 2104/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.05.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අ.භා. 2.57 ට ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

"ගරු හර්ෂණ රාජකරුණා මහතා මූලාසනාරූඪ විය යුතුය"යි, මුදල් අමාත්‍යවරයා යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 4.01 ට ගරු හර්ෂණ රාජකරුණා මහතා මූලාසනාරූඪ විය.)

"ගරු බිමල් රත්නායක මහතා මූලාසනාරූඪ විය යුතුය"යි, අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ අමාත්‍යවරයා යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 5.42 ට ගරු බිමල් රත්නායක මහතා මූලාසනාරූඪ විය.)

"ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා මූලාසනාරූඪ විය යුතුය"යි, රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යවරයා යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 6.24 ට ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**5. සුරාබදු ආඥා පනත යටතේ නිවේදනය (අංක 1) :** මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— සුරාබදු ආඥා පනතේ (52 අධිකාරය) 22 වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 මාර්තු 05 දිනැති අංක 2113/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.05.24 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 01/2019 දරන සුරාබදු නිවේදනය)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6. සුරාබදු ආඥා පනත යටතේ නිවේදනය (අංක 2) :** මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— සුරාබදු ආඥා පනතේ (52 අධිකාරය) 12, 14 සහ 22 වගන්ති සමඟ කියවිය යුතු 32 වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 මාර්තු 05 දිනැති අංක 2113/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.05.24 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 02/2019 දරන සුරාබදු නිවේදනය)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. සුරාබදු ආඥා පනත යටතේ නිවේදනය (අංක 3) :** මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— සුරාබදු ආඥා පනතේ (52 අධිකාරය) 22 වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 මාර්තු 05 දිනැති අංක 2113/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.05.24 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 03/2019 දරන සුරාබදු නිවේදනය)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. කල් තැබීම (යෝජිත සයිබර් ආරක්ෂණ නීති මඟින් මාධ්‍ය නිදහසට සීමා පැනවීම) :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ.භා. 7.20 ට, 2019 ජූනි 19 වැනි බදාදා අ.භා. 1.00 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.